# ඇමෙරිකානු නාවික භටයන් ආපදා සහන කටයුතුවල





**ලලිත් කංකානම්ගේ - හිංතොට/ සමන් කුමාර - බූස්ස**

එක්සත් ජනපද නාවික හමුදාවට අයත් ලේක් ඊරි නෞකාවෙන් පැමිණි සියයකට අධික නාවික පුද්ගලයින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ මැරීන් බළකායට අයත් නාවිකයන් සමග එක්ව ගාල්ල, මාතර සහ කොළඹ යන දිස්ත්‍රික්කවල මානුෂීය උපකාර සහ ආපදා සහන කටයුතුවල පෙරේදා (12) දින නිරත වූහ. මේ අනුව නාවික මැරීන් භටයන් 50 ක් සහ එක්සත් ජනපද නාවික පුද්ගලයින් 119 දෙනකු සමග එක්ව මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ආශ්‍රිත පැති බැම්වල ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතුවල නිරත වීය. තවද මේ සඳහා මාතර ප්‍රාදේශීය ඉංජිනේරු කර්යාලයේ සහායද ලබා ගනු ලැබීය. මේ අතර තවත් මැරීන් භටයින් 21 දෙනකු එක්සත් ජනපද නාවික පුද්ගලයින් 72 දෙනකු සහ ගාල්ල දිස්ත්‍රික්කයේ සහ කොළඹ තෝරාගත් ප්‍රදේශවල රතුකුරුස සමාජයේ සහාය ඇතිව ප්‍රදේශයේ ළිං පිරිසිදු කිරීමේ සහ තවත් පුනරුත්ථාපන වැඩසටහන් කිහිපයක් දියත් කිරීමට කටයුතු කෙරිණි.

එක්සත් ජනපද නාවික හමුදාවට අයත් ලේක් ඊරි නෞකාව දෙසතියක පශ්චාත් ආපදා සහන සැලසීමේ ක්‍රියාන්විතයක් සඳහා ඉකුත් (11) වැනිදින කොළඹ වරායට පැමිණියේය.